# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.08.21

එම්.ඒ.එස්. වික්‍රමනායක මහතා,
අංක. 08,
කුරුවාව,
රත්තොට.

***පැමිණිලි පාර්ශවය***

1.එම්.ජී.යු.අයි.ගුණවර්ධන
(ප්‍ර.පො.ප),
ස්ථානාධිපති, මූලස්ථාන පොලිසිය,
මාතලේ.

2. ඩබ්.ජී.ඒකනායක (උ.පො.ප)
ස්ථානාධිපති (අපරාධ විමර්ශන
අංශය)
මූලස්ථාන පොලිසිය, මාතලේ.

***වගඋත්තර පාර්ශවය***

**පැමිණිලි අංකය** - HRC/KND/466/23/A

**පැමිණිල්ල** -

පැමිණිලිකරු 2023.09.11 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, ස්වාමින් වහන්සේලා පස්නමක් ඇතුළු පිරිසක් කොහොඹිලිවෙල වසමේ වාරියපොල වත්තේ පිහිටි ගොඩනැගිල්ලකට ඇතුල්වීම නිසා හටගත් ආරවුල් සහගත තත්වයක් ඇති වී ඇති බවට හිතවතෙකු විසින් තමාට දුරකථනයෙන් දැනුම් දීමෙන් පසු එකී ප්‍රශ්නය සමකාමීව විසදීම සඳහා තමා එම ප්‍රදේශයේ ආසන සංවිධායක වශයෙන් එකී ආරවුල සමථයකට පත්කිරීමේ අරමුණින් එම ස්ථානයට ගිය බව සඳහන් කර ඇත. එම සිදුවීම 2023.08.17 දින අලුයම සිදුවී ඇති අතර තමා එදින පෙරවරුවේ එම ස්ථානයට යන විටත් මාතලේ පොලිසියේ නිලධාරින් එම ස්ථානයට පැමිණ ස්වාමින්වහන්සේලා ඇතුළු පිරිසගෙන් ප්‍රශ්ණ කරමින් සිටියදී, තමා එම ස්ථානයට ගිය පසුව මාතලේ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති විසින් ස්වාමීන්වහන්සේලා සමඟ තමා ඇතුළු තවත් සිවිල් පුද්ගලයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගැනිමෙන් පසු මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක හා අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් ඉතාමත් පහත් ආකාරයෙන් තමාට බැන වැදී තමා එක්සත් ජාතික


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පක්ෂයේ ආසන සංවිධායක ලෙස සඳහන් කරන අවස්ථාවේ තමාට බැන තර්ජනය කර මාතලේ පොලිසියේ අපරාධ අංශය වෙත ගෙන ගොස් තමා මෙම සිද්ධියට සම්බන්ධ නොමැති බව පැහැදිලි කිරීම සඳහා අවස්ථා කිහිපයකදී උත්සහ කළ ද අපරාධ අංශයේ ස්ථානාධිපති විසින් "*තොපි වගේ දේශපාලඥයින් තමයි රට බංකොලොත් කලේ... තොපි වගේ එවුන් මගේ ලඟට එන්න එපා... කාලකණ්ණි*" ලෙස ප්‍රකාශ කරමින් තර්ජනය කල බවයි.

තවද ස්වාමින්වහන්සේ පස්නම සහ තමා ඇතුළුව තවත් සිවිල් පුද්ගලයින් හත්දෙනෙකු නඩු අංක බී1011/23 යටතේ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර සියලු දෙනා ඇප මත නිදහස් කලහොත් සාමය කඩවීමක් සිදුවිය හැකි බැවින් ඇප ලබාදීමට විරුද්ධව 14 ක් රක්ෂිත බන්ධනාගාර කරන ලෙස ඉල්ලා සිටිය ද මහේස්ත්‍රාත්තුමිය 2023.08.21 දින දක්වා දින 04 ක් බන්ධනාගාරගත කිරීමට නියෝග කර දෙවන නඩුවාරයේදී සියළු සැකකරුවන් ශරීර ඇප මත නිදහස් කළ බවත් සඳහන් කර ඇත.

තමා රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති හා ප්‍රාදේශීය මන්ත්‍රීවරයෙකු ලෙස වසර තිහක සේවයක් සිදුකර මහජන පිළිගැනීමක් ඇතිව දැනට රත්තොට ආසනයේ ආසන සංවිධායක් ලෙස කටයුතු කරන තමාට බැන වැදි පදනම් විරහිත චෝදනා එල්ල කර අත්අඩංගුවට ගැනීම තමාගේ ඉදිරි දේශපාලන කටයුතු සඳහාද බලපාන බව සඳහන් කර ඇත. මෙම සිද්ධිය සිදුවන දින අලුයම් කාලයේ තමා එම ස්ථානයේ නොසිටියදී, තමාට විරුද්ධව කිසිදු සාක්ෂියක් නොමැතිව ඉතාමත් අසාධාරණ ලෙස තමාව අත්අඩංගුවට ගැනීම හා නිර්දය ලෙස බැණවැදීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ පොලිස් නිලධාරීන් සඳහා පොලිස්පති වෙත නිර්දේශ ලබාදෙන ලෙස පැමිණිල්ලේ සහනය වශයෙන් අපේක්ෂා කර ඇත.

**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති සාක්ෂි**

1. මාලේ/ව්‍යාපෘති/පොදු/පොදු/01 හා 2023.05.25 දිනැති ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම වෙනුවෙන් ක්ෂේත්‍ර වාර්තා ලබා ගැනීම යන මැයෙන් දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ කලාප සහකාර අධ්‍යක්ෂ යොමු කර ඇති ලිපි පිටපත.
2. කර්මවාගාචාර්ය අංකුඹුරේ ධර්මකීර්ති ශ්‍රී ගුණරතන සෝරතාභිධාන ස්වාමීන් වහන්සේගේ දිවුරුම් ප්‍රකාශය
3. පිළිමතලාවේ ධම්මසිරි හිමිගේ දිවුරුම් ප්‍රකාශය
4. හෙම්මාතගම ධම්මරතන හිමිගේ දිවුරුම් ප්‍රකාශය
5. රත්නායක මුදියන්සේලාගේ කරුණාරත්නගේ දිවුරුම් ප්‍රකාශය
6. යාසින් මොහොමඩ් හසීන්ගේ දිවුරුම් ප්‍රකාශය
7. නඩු අංක බී1011/23 පිටපත
8. සිදුවීමට අදාල නිලධාරීන්ගේ ඡායාරූප
9. සිදුවීමට අදාළ වීඩියෝ පටය
10. පැමිණිලිකරුගේ දිවුරුම් ප්‍රකාශ

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම -**

1. CB/961/23 හා 2023.09.25 දිනැති ලිපිය මඟින් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එහි, 2023.08.18 වන දින අංක 15, වාරියපොල වත්ත, මාතලේ ලිපිනයේ පදිංචි නිලාදීන් මහරූෆ් යන අය පොලිස් ස්ථානයට පැමිණ මුරකරු වශයෙන් තමන් බලාගනු ලබන වාරියපොල වත්ත නැමති ඉඩමේ පිහිටි පැරණි බංගලාවට එදින අලුයම් කාලයේ වාහන වලින් පැමිණි පිරිසක් ගේට්ටු සහ බංගලාවේ දොර ජනෙල් ද කඩා


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ඇතුල්වී ඒ තුළ බෞද්ධ කොඩි ආදියෙන් සරසා අනවසරයෙන් රැදී සිටින බවට බංගලාවේ හිමිකරු වන බුහාරි යන අයද දැනුවත් කර පැමිණිල්ලක් කර ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව අත්අඩංගුවටගත් පිරිසගේ ප්‍රකාශ සටහන් කර මුලිකත්වය ගෙන කටයුතු කර ඇති හෙම්මාතගම ධම්මරතන හිමි විසින් මෙම බංගලාව හා ඉඩම රජයට අයත් ඉඩමක් බැවින් 2023.08.18 වන දින ඉහත පිරිස සමග අලුයම 03.30 ට පමණ පැමිණ එහි දොර අගුලු කඩා ඇතුල් වී පංසලක් ආරම්භ කිරිමට කටයුතු කිරිමේදී ඉහත පිරිස ඒ සඳහා සම්බන්ධ කර ගත් බවට ප්‍රකාශ කර ඇති බව දක්වා ඇත. පොලිස් ස්ථානයේ පැමිණිල්ල සිදුකල පාර්ශවය විසින් 1862 වර්ෂයේ සුදු ජාතිකයින්ගෙන් මෙම බංගලාව හා ඉඩම සමග අක්කර 400 ට අධික ප්‍රමාණයක් මිලදී ගෙන වාරියපොළ වත්ත ගෘෆ් නමින් නම් කර අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර 200ට අධික මුස්ලිම් ජාතික කොටස්කරුවන් ප්‍රමාණයකින් මේ දක්වා පවත්වා ගෙන යන බවට ඉඩමේ අයිතිය සම්බන්ධ ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බවයි.

මෙම අධිකරණය වෙත මාතලේ මා.උ බී1011/23 යටතේ ඉදිරිපත් කිරිමට කටයුතු කිරීමේදී උ.පො.ප ඒකනායක නිලධාරියා විමර්ශණ නිලධාරියා වශයෙන් හා ස්ථානාධිපති අපරාධ විමර්ශණ අංශය වශයෙන් එදින නඩුවට ඉදිරිපත් වී කරුණු දක්වා ඇති බව දැනුම් දී ඇත. මෙම ඉඩම සහ බංගලාවේ කොටස්කරුවන් මුස්ලිම් ජාතිකයින් වන අතර එම ප්‍රදේශයද මුස්ලිම් හා ද්‍රවිඩ ජාතිකයින්ගෙන් සමන්විත ප්‍රදේශයක් බැවින් මෙම සිද්ධිය මුල් අවස්ථාවේම මෙලෙස විමර්ශණය කර පියවරක් ගැනිම තුල සිංහල හා මුස්ලිම් ජාතිකයින් අතර ජාතිවාදි කොලහාලයක් ඇතිවීම වලක්වා ගැනීමට හා ඇතිවීමට තිබු ප්‍රචණ්ඩ ක්‍රියා වලක්වා ගැනීමට ක්‍රියා කිරිම තුල ප්‍රදේශයේ මහජනතාව හා විවිධ ජන කොටස් වල පැසසුමට ලක්වු බව දක්වා ඇත. ඒ සම්බන්ධව දීර්ඝව අධිකරණය වෙත කරුණු දක්වා 1996 අංක 30 දරන ඇප පනතේ 14 වගන්තියේ උපවගන්ති අනුව සැකකරුවන් ඇප මත මුදවා හැරියහොත් මහජන කැළඹීමක් මෙන්ම ජාතිවාදි ගැටුමක් නිර්මාණය වීමේ ඉඩ කඩ ඇති බවට දැක්වු කරුණු කෙරෙහි ගරු අධිකරණය සළකා බලා සියළු සැකකරුවන් එදින රක්ෂිත බන්ධනාගාර ගත කිරිමට නියෝග කළ බව සඳහන් කර ඇත.

කෙටි කාලයක් තුල ඉඩමේ හා බංගලාවේ හිමිකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රකාශ සටහන් කර තවද පෙත්සම්කරු ඇතුලු සැකකරුවන් ඊළග නඩු දිනයේදී ඇප ලබා ගැනිමට කරන ලද ඉල්ලීමට පොලිසිය විරුද්ධ නොවු බවත්, සැකකරුවන් අතර සිටි පිරිසගෙන් අනන්‍යතාවයක් තහවුරු කර ගැනීමට නොහැකි වු සැකකරුවන් කිහිප දෙනෙකුට ඇප ලබාදීමේදී ඒ පිළිබදව අවධානය යොමු කිරිමට පමණක් අධිකරණයෙන් ඉල්ලිමක් කර ඇති අතර,පෙත්සම්කරු සඳහන් කරන ආකාරයට පෙත්සම්කරුට හෝ ස්වාමින් වහන්සේලාට ඇප දීම සම්බන්ධව කිසිදු විරෝධයක් පොලිසිය විසින් දක්වා නොමැති බවයි.

ස්ථානයේ බල අපරාධ 90/2023 යටතේ පැමිණිල්ල ලේඛන ගතකර මූලික විමර්ශණ ආරම්භ කර තමා සහ අපරාධ විමර්ශණ අංශයේ ස්ථානාධිපති උ.පො.ප. ඒකනායක නිළධාරියා ඇතුලු නිළධාරින් කණ්ඩායමක් සමග අපරාධ ස්ථානය ගොස් පරීක්ෂණ පැවැත්වූ බව සඳහන් කර ඇත. පැරණි බංගලාව තුළ හා එම භූමිය තුල බෞද්ධ කොඩි වලින් සරසා බුදු පිළිමයක් බංගලාව මැද සාලය කොටසේ තැන්පත් කර බෞද්ධ භික්ෂූන් වහන්සේලා 05 ක් සමග ගිහි පුද්ගලයින් (පෙත්සම්කරු ද සමගින්) 07ක් එම බංගලාව තුළ රැඳී සිටි බවත්, පොලිස් ස්ථානයේ පැමිණිල්ල සිදුකල අය විසින් එම බංගලාවේ දොර ජනේල් සඳහා යොදා තිබු ඉබියතුරු ඇතුළු අනෙකුත් අගුල් කඩා වෙනත් ඉබි යතුරු අගුල් යොදා ඇති බවට කරන ලද දැනුම්දීම මත ඒ අවස්ථාවේදී එහි රැදී සිටි පිරිස රාත්‍රි කාලයේ නිවසක් බිදීම, දේපල වලට අනර්ථය සිදු කිරිම හා නීති විරෝධි රැස්විමක සාමාජිකයින්විම යන වරදවල් වෙනුවෙන් අත්අඩංගුවට ගෙන ඇති බවයි. පැමිණිලිකරු සඳහන් කර ඇති ආකාරයට වසර 30ට අධික කාලයක් මහජන ප්‍රසාදය දිනා සිටි අයෙකු නම් මෙම සිද්ධියේදී මූලිකත්වය ගෙන සිටි ස්වාමින් වහන්සේලා හා ගිහි පිරිස සිදුකල නීති විරෝධි කටයුතු නොකරන ලෙස හා එවැනි ක්‍රියාවක් තුලින් සිදුවිය හැකි මහජන කැළඹීම්, ජාතිවාදී හා ආගම්වාදි කැරලි ගැන පහදා දී අදාල පොලීසිය

දැනුවත් කර නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීමට පියවර ගැනිම වුවත්, එවැනි කිසිදු පියවරක් නොගෙන මෙවැනි නීති විරෝධි කටයුක්තක නියලෙමින් සිදුවීමට තිබූ අරාජික තත්වය මැඩලීමට කටයුතු සිදු කල පොලිස් නිලධාරින් හට අසත්‍ය හා ව්‍යාජ චෝදනා නැගීම සුදුසු නොවන බවයි.

තව ද ඉහත සිදුවීම් විය හැකි බවට පොලීසිය විසින් කරුණු දැක්විමක් ස්ථිරව සිදු කරනු ලබන්නේ මෙම සිදුවීමේ මූලිකත්වය ගෙන ක්‍රියා කල හෙම්මාතගම ධම්මරතන හිමිගේ මින් පෙර දිවයින තුල ජාතිවාදි ගැටුම් වලදි මූලිකව ක්‍රියා කර ඇති බවට හදුනාගෙන ඇති ඩෑන් ප්‍රියසාද් වැනි පුද්ගලයින් සමග දුරකථනය සබඳතා පවත්වා ඇති බවට එම අවස්ථාවේ කරන ලද පරික්ෂාවේදි අනාවරණය වී ඇති බව සඳහන් කර ඇත. මෙම විමර්ශණය තුල කිසිදු අවස්ථාවක අන්නෝමතික අත් අඩංගුවට ගැනීමක් හෝ නීති විරෝධි රදවා ගැනීමක් හෝ පහරදීමක් හෝ සිදු කර නොමැති හෙයින් පෙත්සම්කරු සදහන් කර ඇති ආකාරයේ සිදුවීමක් වී නොමැති හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10, 11, 12,13, 14 ව්‍යවස්ථාවන් කිසිවක් වගඋත්තරකරුවන් විසින් කඩ කර නොමැති බවට විමර්ශණ සටහන් අනුව නිරික්ෂණය කර ගත හැකි බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

2. 2023.12.01 දින කොමිෂන් සභාවේ පැවති පරික්ෂණ අවස්ථාවේ දී, මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන සහ උ.පො.ප ඩබ්ලිව්.යූ.ඒකනායක විසින් බංගලාවට අයුතු ඇතුල්වීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ල අනුව අදාල ස්ථානයට ගොස් විමර්ශන කටයුතු සිදුකිරීමෙන් පසු අයුතු ජනරාශියක සාමාජිකයකුවීම යන චෝදනා යටතේ පැමිණිලිකරු ඇතුළු පිරිස අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් පැමිණිල්ලේ චෝදනා ප්‍රතික්ෂේප කරන බව ප්‍රකාශ කර ඇත.

**පරික්ෂණයේ දී අනාවරණය වූ කරුණු හා නිරීක්ෂණ -**

1. පැමිණිලිකරු 2023.08.17 අලුයම් කාලයේදී මාතලේ කොහොඹිලිවෙල වසමේ වාරියපොල වත්තේ පිහිටි වතුබංගලා ගොඩනැගිල්ලේ විහාරස්ථානයක් ආරම්භ කිරීම සඳහා ස්වාමීන් වහන්සේලා ඇතුළු ගිහි පිරිසක් ඇතුළුවීම හේතුවෙන් ඇතිවූ ආරවුලක් සමථයකට පත් කිරීමේ අරමුණින් පෙ.ව 9.30-10.30ත් අතර කාලයේ දී එම ස්ථානයට ගිය අවස්ථාවේ දී එම ස්ථානයේ සිටි මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන සහ අපරාධ අංශයේ ස්ථානාධිපති ඩබ්.පී. ඒකනායක යන අය ඔහුට පදනම් විරහිත චෝදනා එල්ල කරමින්, අපහාස සහ තර්ජන මෙන්ම පහත් වචන භාවිත කරමින් මෙම සිද්ධියට කිසිදු සම්බන්ධයක් නොමැතිව ඔහුව අසාධාරණ ලෙස අත්අඩංගුවට ගෙන නඩුවේ විත්තිකරුවෙකු ලෙස නම් කිරීමෙන් ඔහුගේ ගෞරවය සහ දේශපාලන කටයුතු බිඳවැටී ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.
2. පැමිණිලිකරු මෙම සිදුවීම 2023.08.17 දින සිදුවූ බව සඳහන් කර ඇති අතර, CB/961/23 හා 2023.09.25 දිනැති ලිපිය මඟින් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන විසින් මෙම සිදුවීම 2023.08.18 දින සිදුවූ බවත්, පැමිණිල්ල මඟින් බංගලාවේ දොර ජනේල් අගුල් කඩා වෙනත් ඉබි යතුරු අගුල් යොදා ඇති බව සඳහන්ව ඇති බැවින්, ඒ අවස්ථාවේදී එම ස්ථානයේ රැදී සිටි පිරිස රාත්‍රි කාලයේ නිවසක් බිදීම, දේපල වලට අනර්ථය සිදු කිරිම හා නීති විරෝධි රැස්වීමක සාමාජිකයින්වීම යන වරදවල් වෙනුවෙන් අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ දී සැකකරුවන් ඇප මත මුදවා හැරියහොත් මහජන කැළඹීමක් මෙන්ම ජාතිවාදි ගැටුමක් නිර්මාණය වීමේ ඉඩ කඩ ඇති බවට කරුණු දක්වා ඇති බව සඳහන් කර ඇත. තව ද මෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කල හෙම්මාතගම ධම්මරතන හිමි මින් පෙර දිවයින තුල ජාතිවාදි ගැටුම් වලදි මූලිකව ක්‍රියා කර ඇති බවට හදුනාගෙන ඇති ඩෑන් ප්‍රියසාද් වැනි පුද්ගලයින් සමග දුරකථන සම්බන්ධතා පවත්වා ඇති බවට පරික්ෂාවේදි අනාවරණය වී ඇති බවට පොලිසිය විසින් ස්ථිරව කරුණු දැක්වීමක් සිදු කරන බව


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

කොමිෂන් සභාව වෙත සඳහන් කර ඇති නමුත් එවැනි විමර්ශන සොයා ගැනීමක් පිළිබඳව අධිකරණය වෙත කරුණු වාර්තා කර නොමැති බව නිරීක්ෂණය වේ

3. හෙම්මාතගම ධම්මරතන හිමි දිවුරුම් ප්‍රකාශයක් මඟින්, B1011/23 දරණ නඩුවේ පළමුවන විත්තිකරු වන බවත්, මෙම සිදුවීම 2023.08.17අලුයම 4.30 ත් 5.00ත් අතර කාලයේ සිදුවූ බව සඳහන් කර ඇත. එම ස්ථානයට ඔවුන් ඇතුල්වන අවස්ථාවේ මනන්ගොඩගේ අතුල සුධර්මන් වික්‍රමනායක මහතා අදාල ස්ථානයේ ඔවුන් සමඟ නොසිටි බවත්, මෙම සිද්ධියට කිසිම අයුරකින් සම්බන්ධයක් නොමැති බව වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන බවත්,මේ සිදුවීමෙන් පසු තමා උදේවරුවේ මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බංඩාර මහතාගේ හිතවතෙකු සමග අදාල සිද්ධිය සම්බන්ධව කරුණු කීමෙන් පසු ඔහු විසින් රත්තොට එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායක වශයෙන් අතුල වික්‍රමනායක මහතාට මෙම ආරවුල දැනුම්දීම මත ඔහු මෙම ආරවුල සමතයකට පත් කිරීමේ චේතනාවෙන් හා සද්භාවයෙන් එම ස්ථානයට පැමිණි බවත් සඳහන් කර ඇත. මහජන නියෝජිතයෙකු වූ ඔහු ආරවුල සමථයකට පත් කිරීමේ අදහසින් යුතුව එම ස්ථානයට පැමිණියේ එදින මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතා ඇතුළු නිලධාරීන් ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් සිටි අවස්ථාවේදී බවත්, ඒ වන විටත් එම ස්ථානයේ මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ජී.යූ. අයි. ගුණවර්ධන මහතා සහ අපරාධ අංශයේ ස්ථානාධිපති ඩබ්.පී. ඒකනායක යන මහත්වරුන් පැමිණ සිටි බවත් ඉන් සුළු වේලාවකට පසුව එතැනට පැමිණි අතුල සුධර්මන් වික්‍රමනායක මහතා *"මම රත්තොට එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක "* ලෙස සඳහන් කළ නමුත් එය නොතකා පදනම් විරහිතව මෙම සිද්ධියට සම්බන්ධ බවට චෝදනා කරමින් අත්අඩංගුවටගත් බවත් ප්‍රකාශ කර ඇත. තවද මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන මහතා අතුල වික්‍රමනායක මහතාව පොලිස් ජීප්රථයට නංවාගෙන සිටිය දි පොලිස් පරීක්ෂකතුමා පැලඳ සිටි මුඛ ආවරණය අර්ධ වශයෙන් ඉවත්කොට *“තමුසේ මාව අඳුරනවාද? දවසක් මම තමුසේ පව් කියලා අතෑරියා. අද බලා ගන්නම් යමංකෝ...”* ලෙස සඳහන් කල බවයි.එසේම, ඩබ්.පී. ඒකනායක මහතා විසින් ඔවුන් සියළු දෙනා අපරාධ අංශයට රැගෙන ගොස් කට උත්තර ලබා ගැනීමේ දී මේ සම්බන්ධව ස්ථානාධිපතිවරයාට දුරකථන පණිවිඩ එනවිට අතුල වික්‍රමනායක මහතාට අපහාස වන ආකාරයේ විවිධ ප්‍රකාශ කරමින් *“හාමුදුරුවන් විතරක් නෙවෙයි රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතියත් ගෙවල් බිදින්ට සම්බන්ධ වෙලා තියෙනවා”* යනුවෙන් දුරකථන වලට පිළිතුරු ලබාදුන් බැවින් ඔහු තම නිර්දෝෂීභාවය ප්‍රකාශ කිරීමට යාමට සූදානම් වූ අවස්ථාවේ *"තොපි වගේ දේශපාලනඥයන් තමයි රට බංකොලොත් කළේ, තොපි වගේ එවුන් මගේ ලඟටවත් එන්න එපා. කාලකණ්ණි...”* යනුවෙන් ප්‍රකාශ කල බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධියේ පොලිස් ස්ථානයේ පැමිණිල්ල සිදු කල මුස්ලිම් ජාතිකයන් සහ පොලිස් නිලධාරීන් සහ ස්වාමීන් වහන්සේ ඇතුළු සියළු දෙනා ඉදිරියේ ඔහුව ලැජ්ජාවට, අපහාසයට, බියටත් පත් කරන ලද බවයි. මෙම ආරවුල සිදු වූ අවස්ථාවේ එම ස්ථානයේ නොසිටි අතුල සුධර්මන් වික්‍රමනායක මහතා මෙම සිද්ධියට අදාළව මාතලේ පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම සහ ඔහු මෙම සිද්ධියට අදාළ නඩුවේ විත්තිකරුවෙකු ලෙස නම් කිරීම ඉතාමත්ම අසාධාරණ හා පදනම් විරහිත බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

4. කර්මවාගාචාර්ය අංකුඹුරේ ධර්මකීර්ති ශ්‍රී ගුණරතන සෝරතාභිධාන ස්වාමීන් වහන්සේ විසින් දිවුරුම් ප්‍රකාශයක් මඟින්, මාතලේ මහෙස්ත්‍රාත් අධිකරණයේ B1011/23 දරණ නඩුවේ දොළොස්වන විත්තිකරු වන බවද මෙම සිද්ධිය 2023.08.17අලුයම 4.30 ත් 5.00ත් අතර කාලයේ සිදුවූ බවත්, එම ස්ථානයට ඔවුන් ඇතුල්වන අවස්ථාවේ මනන්ගොඩගේ අතුල සුධර්මන් වික්‍රමනායක මහතා ස්ථානයේ ඔවුන් සමග නොසිටි බවත් මෙම සිද්ධියට කිසිම අයුරකින් සම්බන්ධයක් නොමැති බව වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන බවයි. මහජන නියෝජිතයෙකු වූ ඔහු මෙම ආරවුල සමථයකට පත් කිරීමේ අදහසින් යුතුව එම ස්ථානයට පැමිණියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතා ඇතුළු නිලධාරීන් ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් සිටි අවස්ථාවේදී බවත්, ඒ වන විට මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන මහතා සහ අපරාධ අංශයේ ස්ථානාධිපති ඩබ්.පී.

ඒකනායක යන මහත්වරුන් විසින් එම ස්ථානයේ සිටියදී ඉන් සුළු වේලාවකට පසුව එහි පැමිණි අතුල සුධර්මන් වික්‍රමනායක මහතා " *මම රත්තොට එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක*" ලෙස සඳහන් කළද එය නොතකා පදනම් විරහිතව මෙම සිද්ධියට සම්බන්ධ බවට චෝදනා කරමින් අත්අඩංගුවට ගත් බවත්,මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.පී.යූ.අයි. ගුණවර්ධන මහතා අතුල වික්‍රමනායක මහතාව පොලිස් පිප්රථයට නංවාගෙන සිටිය දී පොලිස් පරීක්ෂකතුමා පැලඳ සිටි මුඛ ආවරණය අර්ධ වශයෙන් ඉවත්කොට "*තමුසේ මාව අඳුරනවාද? දවසක් මම තමුසේ පව් කියලා අතෑරියා. අද බලා ගන්නම්" යමංකෝ...*" කියා තර්ජනාත්මකව පැවසූ බව ප්‍රකාශ කර ඇත.

තවද අපරාධ අංශයේ ස්ථානාධිපති ඩබ්.පී. ඒකනායක මහතා විසින් ස්වාමීන් වහන්සේලා ඇතුළු සියළු දෙනා අපරාද අංශයට රැගෙන ගොස් කට උත්තර ලබා ගැනීමේ දී මේ සම්බන්ධව ස්ථානාධිපතිවරයාට දුරකථන පණිවිඩ එන විට ස්වාමීන් වහන්සේලාට සහ වික්‍රමනායන මහතාට අපහාසවන ආකාරයේ විවිධ ප්‍රකාශ කරමින් එම දූරකථන වලට පිළිතුරු ලබාදුන් බවත්, එම අවස්ථාවේ ඔවුන් සම්බන්ධව පොලිස් ස්ථානයට පැමිණිලි කල මුස්ලිම් ජාතිකයන් දෙදෙනාද එම ස්ථානයේ සිටියදී අතුල වික්‍රමනායක මහතා තම නිර්දෝෂිභාවය ප්‍රකාශ කිරීමට යාමට සූදානම් වූ අවස්ථාවේ "*තොපි වගේ දේශපාලනඥයන් තමයි රට බංකොලොත් කළේ. තොපි වගේ එවුන් මගේ ලඟටවත් එන්න එපා. කාලකණ්නි...*" යනුවෙන් ප්‍රකාශ කරන ලද බව සඳහන් කර ඇත. තව ද ආසන සංවිධායකවරයාට ද "*මේකා තමයි මේකේ නායකයා මේකත් එක්ක ගිහිල්ලා තමයි ගෙවල් කඩලා තියන්නේ*" ලෙස එහි සිටි සියළු දෙනාට ඇසෙන පරිදි හා දුරකථනයෙන් කථා කල අයටත් විටින් විට ප්‍රකාශ කරමින් ඔහු ලැජ්ජාවට,අපහාසයට හා භීතියට පත් කරන ලද බවත්, ප්‍රකාශ කර ඇත.එහිදී ඩබ්.ජී. ඒකනායක මහතා තමාව පෙන්නා "*මේ මගේ ගමේ පංසලේ හාමුදුරුවෝ මුංට දානෙ දෙන්න යන කිසිම වෙලාවක පංසලේ නෑ ආයේ මං දානේ ටිකක්වත් මුංට දෙන්නේ නෑ* " සහ " *මේ හාමුදුරුවරු ටික රට හරක් මස් උයාගෙන කාපු බෝල් එකක් තිබෙන බව්*"ද එයද උසාවියට ඉදිරිපත් කරන බව සඳහන් කර අපහාස කල බවයි. උසාවි ගෙන යෑමට පෙර මුස්ලිම් ජාතිකයන් දෙදෙනා අපරාධ අංශයෙන් බැහැර වන විට අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා ඔවුන් සමගම ඔහුගේ කාමරයෙන් එළියට පැමිණෙමින් " *හවසට පාටියක් ඕන* " කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

5. පිළිමතලාවේ ධම්මසිරි හිමි දිවුරුම් ප්‍රකාශ මඟින්, B1011/23 දරණ නඩුවේ දෙවන විත්තිකරු වන බවත්,උන්වහන්සේ අවුරුදු 15 ක ශිෂ්‍ය භික්ෂුවක් වුවද, සියළු දෙනා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමෙන් පසු වැඩිහිටි ස්වාමීන් වහන්සේලා හා අනෙකුත් සිරකරුවන් සමග දින 04 ක් රඳවා තබා ගත් බව සඳහන් කර ඇත. මෙම සිදුවීම 2023.08.17අලුයම 4.30 ත් 5.00ත් අතර කාලයේ සිදුවූ බවත්, එම ස්ථානයට ඔවුන් ඇතුල්වන අවස්ථාවේ මනන්ගොඩගේ අතුල සුධර්මන් වික්‍රමනායක මහතා අදාල ස්ථානයේ ඔවුන් සමග නොසිටි බවත්, මෙම සිද්ධියට කිසිම අයුරකින් සම්බන්ධයක් නොමැති බව වගකීමෙන් ප්‍රකාශ කර බව සඳහන් කර ඇත. මහජන නියෝජිතයෙකු වූ ඔහු මෙම ආරවුල සමථයකට පත් කිරීමේ අදහසින් යුතුව එම ස්ථානයට පැමිණියේ එදින මුලස්ථාන පොලිස් පරීක්ෂක මහතා ඇතුළු නිලධාරීන් අපගෙන් ප්‍රශ්න කරමින් සිටි අවස්ථාවේදී බවත්, එම අවස්ථාවේ දී ස්ථානයේ රැඳීසිටි මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.ජී.යූ.අයි. ගුණවර්ධන මහතා සහ අපරාධ අංශයේ ස්ථානාධිපති ඩබ්.ජී. ඒකනායක යන මහත්වරුන් පැමිණ සුළු වේලාවකට පසුව ඔහු එතැනට පැමිණි අතුල සුධර්මන් වික්‍රමනායක මහතා "*මම රත්තොට එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක*" ලෙස සඳහන් කරන අවස්ථාවේ එය නොතකා පදනම් විරහිතව මෙම සිද්ධියට සම්බන්ධ බවට චෝදනා කරමින් අත්අඩංගුවට ගත් බවත්, මාතලේ පොලිසියේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක එම්.පී.යූ.අයි. ගුණවර්ධන මහතා අතුල වික්‍රමනායක මහතාව පොලිස් පිප්රථයට නංවාගෙන සිටිය දි පොලිස් පරීක්ෂකතුමා පැලඳ සිටි මුඛ ආවරණය අර්ධ වශයෙන් ඉවත්කොට "*තමුසේ මාව අඳුරනවාද? තමුසේව අල්ලගන්න මං හුගාක් කාලයක් තිස්සෙ බලාන හිටියේ, දවසක් මම තමුසේ පව් කියලා අතෑරියා. අද බලා ගන්නම්..යමං...*"කියා තර්ජනාත්මකව පවසන ලද බවයි.



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ඩබ්.පී. ඒකනායක මහතා විසින් ස්වාමීන් වහන්සේලා සියළු දෙනා අපරාද අංශයට රැගෙන ගොස් කට උත්තර ලබා ගැනීමේ දී මේ සම්බන්ධව ස්ථානාධිපතිවරයාට දුරකථන පණිවිඩ එනවිට අතුල වික්‍රමනායක මහතාට හා ස්වාමීන් වහන්සේලාට අපහාසවන ආකාරයේ විවිධ ප්‍රකාශ කරමින් *“හාමුදුරුවන් විතරක් නෙවෙයි රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතියත් ගෙවල් බිදින්ට සම්බන්ධ වෙලා තියෙනවා”* යනුවෙන් දුරකථන වලට පිළිතුරු ලබාදුන් අතර ඔහු තම නිර්දෝෂීභාවය ප්‍රකාශ කිරීමට යාමට සූදානම් වූ අවස්ථාවේ *" තොපි වගේ දේශපාලනඥයන් තමයි රට බංකොලොත් කළේ. තොපි වගේ එවුන් මගේ ළඟටවත් එන්න එපා. කාලකණ්නි....”* යනුවෙන් ප්‍රකාශ කළ බවත්, ස්වාමීන් වහන්සේලාට *“මුංට දානේ වළඳලා පංසල්වලට වෙලා ඉන්න බැරුව ඉඩම් අල්ලන්න යනවා, මුං රැට හරක් මස් උයාගෙන කාපු බෝල් එකක් තියෙනවා එකත් උසාවියට ඉදිරිපත් කරනවා”* වශයෙන් සංඝරත්නයට අනායාගමික පිරිස ඉදිරියේ අපහාසාත්මකව හා නින්දිත ආකාරයෙන් බැන වැදුණ බව සඳහන් කර ඇත.

උන්වහන්සෙ නැවත දිවුරුම් ප්‍රකාශයක් මඟින් කරුණු දක්වමින්, පිරිස අත්අඩංගුවට ගත් මාතලේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.පී.යූ.අයි. ගුණවර්ධන මහතා වර්ෂයක පමණ සිට තමා දන්නා හඳුනන දායකයෙක් බවත්, මාස කිහිපයකට පෙර ඔවුන්ගේ ඉල්ලීම මත ඔහු ඇතුළු මාතලේ පොලිස් ස්ථානයේ සේවය කරන නිලධාරීන් හය දෙනෙකුට හා එක් නිලධාරිණියකට සේවය අගය කොට ගෞරව සම්මාන කිසිදු මුදලක් අයකිරීමකින් තොරව ස්වේච්ඡාවෙන් ලබාදුන් බව සඳහන් කර ඇත.තවද දැනට මාස කිහිපයකට පෙර නිදහස්ව පවතින මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම සම්බන්ධව මාතලේ ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.පී.අයි.යූ. ගුණවර්ධන මහතාට ඉඩම සම්බන්ධව අයිතිකරුවෙකු නොමැති බැවින් තමා පංසලක් සාදා ගැනීමට පදිංචියට යෑමට සිටින බව සඳහන් කල බවත්, ඒ අවස්ථාවේදී ඔහු විසින් *"කමක් නැහැ හාමුදුරුවනේ ඔබ වහන්සේ වැඩලා පදිංචි වෙන්න. ඉඩම් සම්බන්දව පොලිසියට අයිතියක් නැහැ ඒවා සිවිල් අධිකරණයේ විසදිය යුතු ප්‍රශ්න... මට පුලුවන් ආකාරයේ උදව්වක් මම කරන්නම් "*ලෙස ප්‍රකාශ කළ බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

6. හෙම්මාතගම ධම්මරතන හිමි, පිළිමතලාවේ ධම්මසිරි හිමි, අංකුඹුරේ ධර්මකීර්ති හිමි හා ගුණරතන හිමි විසින් ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශ අනුව, ස්වාමීන් වහන්සේලා ඇතුළු පිරිස 2023.08.17 වන දින අළුයම 4.30ත් 5.30 ත් අතර කාලයේ දී බංගලාවට ඇතුළු වී ඇති බවත්, එම වේලාවේදී අතුල සුධර්මන් වික්‍රමනායක මහතා ස්ථානයේ නොසිටි බවත්, පසුව ඔහු උදේ කාලයේදී පොලිස් නිලධාරීන් ස්ථානය වෙත පැමිණ සිටිය දී ආරවුල සමථයකට පත්කර ගැනීමේ අරමුණින් පැමිණ ඇති බව දිවුරුම් ප්‍රකාශ මඟින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.

7. ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ අනුව, වින්දිත අතුල වික්‍රමනායක විසින් වගඋත්තරකරුවන්ට ඔහු රත්තොට එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක බවත් මෙම සිදුවීමෙන් පසුව ඔහු එම ස්ථානයට පැමිණි බව සඳහන් කිරීමේ දී, වගඋත්තර 01 ප්‍ර.පො.ප එම්.ජී.යූ.අයි ගුණවර්ධන විසින්, *“තමුසේ මාව අඳුරනවාද? තමුසේව අල්ලගන්න මං හුගාක් කාලයක් තිස්සෙ බලාන හිටියේ, දවසක් මම තමුසේ පච් කියලා අතෑරියා. අද බලා ගන්නම් යමං... ”* ලෙස ප්‍රකාශ කර ඇති බවත්, මාතලේ පොලිස් ස්ථානය තුළදී වගඋත්තර 02 අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප ඒකනායක විසින් අනෙක් පිරිස ඉදිරියේ ප්‍රසිද්ධියේ සහ දුරකථන ඇමතුම් මඟින් “හාමුදුරුවන් විතරක් නෙවෙයි රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතියත් ගෙවල් බිදින්ට සම්බන්ධ වෙලා තියෙනවා”, *" තොපි වගේ දේශපාලනඥයන් තමයි රට බංකොලොත් කළේ. තොපි වගේ එවුන් මගේ ළඟටවත් එන්න එපා. කාලකණ්නි....”* සහ *“මේකා තමයි මේකේ නායකයා මේකත් එක්ක ගිහිල්ලා තමයි ගෙවල් කඩලා තියන්නේ”* වශයෙන් අවමන් සහගත ප්‍රකාශයන් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

8. වගඋත්තර පාර්ශවය විසින් 2023.09.25 දිනැතිව ඉදිරිපත් කර ඇති වාර්තාවේ, මෙම සිදුවීමේ මූලිකත්වය ගෙන කටයුතු කල හෙම්මාතගත ධම්මරතන හිමි ඇතුළු පිරිස අලුයම 3.30ට පැමිණි බවට



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පැමිණිල්ලෙන් සඳහන් කර ඇති බව දැනුම් දී ඇති අතර, 2023.08.17 පැය 17.50 පිටුව 35 ඡේදය 326 සිට ඉදිරියට සිදුවීමට අදාළ සැකකරුවන් පොලීසිය වෙත ලබා දී ඇති ප්‍රකාශයන්හි එම ස්වාමීන් වහන්සේ ඇතුලු සිදුවීමට සැකපිට අත්අඩංගුවට ගත් පිරිසට අයත් අයවලුන්ගේ ප්‍රකාශයන්හි අතුල සුධර්මන් වික්‍රමනායක මහතාගේ නම හෝ ඔහුගේ මෙහෙයවීමෙන් සහ අනුදැනුම මත මෙලෙස කටයුතු සිදුකර ඇති බවට කරුණු දක්වා නොමැති අතර, ප්‍රකාශයන් අනුව කිසිවකුත් ඔහු පිළිබඳව කිසිදු කරුණක් සඳහන් කර නොමැති අතර ඔහු විසින් ලබා දී ඇති ප්‍රකාශයේ ද මෙම සිදුවීමෙන් පසුව ඔහු එම ස්ථානය වෙත පැමිණි බවට කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

9. රත්නායක මුදියන්සේලාගේ කරුණාරත්න විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙමින්, නඩු අංක බී1011/23 දරණ නඩුවේ පළමු සැකකරු වන හෙම්මාතගම ධම්මරතන හිමි විසින් 2023 අගෝස්තු මස 17 දින උදේ 8.30 ට පමණ මෙම සිද්ධිය ඔහුට දැනුම් දුන් පසු ඔහු ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බංඩාර වෙත දැනුම් දීමෙන් පසුව එතුමා තමාට මාතලේ මූලස්ථාන පොලිස් පරීක්ෂක වන උපුල් ගුණවර්ධන මහතාට මෙය සාමකාමීව විසඳන ලෙස උපදෙස් දුන් බව සඳහන් කළ බැවින් හෙම්මාතගම ධම්මරතන ස්වාමින් වහන්සේට පොලීසිය පැමිණි විට සාමකාමීව විසඳ ගන්නා ලෙස තමා දැනුම් දුන් බව සඳහන් කර ඇත. ඒ අනුව තම හිතවත් එක්සත් ජාතික පක්ෂයේ රත්තොට ආසනයේ ප්‍රධාන සංවිධායක අතුල වික්‍රමනායක දුරකතනයෙන් *"ඔබතුමාගේ ආසනයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොහොඹිලිවෙල ග්‍රාමසේවක වසමේ LRCයට අයත් වාරියපොල වත්තේ බංගලාවක එක් දිනක් ඔබතුමා විසින් මට හඳුන්වා දුන් කන්දේ නුවර පංසලේ හෙම්මාතගම ධම්මරතන හිමි පංසලක් ආරම්භ කිරීමට ගිහින් ඉන් ප්‍රශ්නයක් ඇති කරගෙන ඇති බැවින් ඔබතුමාට පුලුවන්නම් ගිහින් මෙය සාමකාමීව විසඳන්න මැදිහත් වන ලෙස"* ඉල්ලීමක් කල බව සඳහන් කර ඇත. මේ සම්බන්ධව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බංඩාර මහතා මාතලේ මූලස්ථාන පොලිස් පරීක්ෂක උපුල් ගුණවර්ධන මහතා හට මෙය සාමකාමීව විසඳන ලෙස උපදෙස් දුන් බවත් ඔහු අතුල වික්‍රමසිංහ වෙත දැනුම් දුන් බවත් එහිදී ඔහු තමාට *"මගුල් ගෙදරකටත් යන්න තියෙනවා කොහොමහරි එතෙන්ටත් මම ගිහින් එන්නම්"* ලෙස සඳහන් කල බවයි. පසුව තමාට එම ස්ථානයට ගිය අතුල වික්‍රමනායක මහතා කිසිදු විභාගයකින් තොරව සහ පදනම් විරහිතව චෝදනා නගමින් අත්අඩංගුවට ගත් බව දැන ගන්නට ලැබුණු බව අතුල වික්‍රමනායක මහතා ඔහු අත්අඩංගුට ගැනීම හා මෙම සිද්ධියට අදාළ නඩුවේ විත්තිකරුවෙකු ලෙස නම් කිරීමත් ඉතාමත්ම අසාධාරණ හා පදනම් විරහිත බව වැඩිදුරටත් ඉන් ප්‍රකාශ කර ඇත.

10. යාසින් මොහොමඩ් හර්ස් යන අය දිවුරුම් ප්‍රකාශයක් මඟින්, 2023 අගෝස්තු මස 17 වන දින පෙ.ව. 7.00 ත් 7.30 ත් අතර කාලයේ එක්සත් ජාතික පක්ෂයේ රත්තොට ප්‍රධාන ආසන සංවිධායක අතුල සුදර්මන් වික්‍රමනායකට ඔහුගේ ජංගම දුරකථනයෙන් කථාකර පක්ෂයේ ලියකියවිලි කිහිපයක් අවශ්‍ය බව ප්‍රකාශ කළ විට අතුල වික්‍රමනායක මහතා *"තව ටිකකින් මම මාතලේ හිතවතෙකුගේ පුතාගේ විවාහ මංගල්‍යයට එන විට එම ලිපි රැගෙන වන බවත්, මාතලේ දී ඒවා ලබාගත හැකි බවත් ඔහුට මාතලේට එන ලෙසත්"* දන්වා සිටි බවයි. තමාට එදින අලුයම වාරියපොල වත්තේ බංගලාවට හාමුදුරු පස්නමක් සමග තවත් පුද්ගලයන් කිහිප දෙනෙකු බලහත්කාරයෙන් පදිංචියට පැමිණ ඇති බව උදේ ආරංචි වූ බවත්, එම අසාධාරණය ඔහුට දැනුම් දීමට ඔහුගේ ජංගම දුරකථනයට තම ජංගම දුරකථනයෙන් ඇමතුම් කිහිපයක් ලබා දුන්නත් එතුමා ඒ අවස්ථාවේ දුරකථනයට සම්බන්ධ නොවූ බවත්, එම සිද්ධිය සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අනුරුද්ධ බංඩාර නායක මහතාගේ හිතවතෙකු වන රත්තොට ලෝන්විල් පදිංචි ආර්.එම්. කරුණාරත්න මහතාගේ ඉල්ලීම මත එම සිද්ධිය සමථයකට පත්කිරීමට ගිය රත්තොට ආසන සංවිධායක අතුල වික්‍රමනායක මහතා ද එම ස්ථානයේ දී අත්අඩංගුව ගෙන ඇති බව සවස තමාට දැනගන්නට ලැබු බවයි. අලුයම එම ස්ථානයට හාමුදුරුවන් ඇතුළු පිරිස පැමිණීමේ දී අතුල වික්‍රමනායක එම ස්ථානයේ නොසිටි බවට තමාට වගකීමෙන් ප්‍රකාශ කරනුයේ තමා උදෑසන ඔහුට දුරකථන ඇමතුම් ලබාදීමේ දී ඔහු නිවසේ සිටිය බැවින් බවත් මෙම



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

සිදුවීම සමතයකට පත්කිරීමට එදින පෙරවරුවේ එම ස්ථානයට ගිය මහජන නියෝජිතයා අත්අඩංගුවට ගැනීම පදනම් විරහිත බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

11. පැමිණිල්ලට අදාල සාක්ෂි ලෙස දිවුරුම් ප්‍රකාශ ලබාදී ඇති ආර්. එම්. කරුණාරත්න සහ යාසින් මොහොමඩ් හරිස්ගේ ප්‍රකාශන් අනුව පැමිණිලිකරු 2023.08.17 දින උදෑසන 8.30 ට පමණ නිවසේ සිටිය දී දුරකථනය මඟින් මෙම සිදුවීම දැනුම්වත් කිරීම මත එම ස්ථානය වෙත උදෑසන පිටත්ව ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

12. මාතලේ පොලිස් ස්ථානයේ ග්‍රහණ අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.08.17 පැය 08.00 ට පිටුව 12 ඡේදය 316 යටතේ අදාල වතු බංගලාවට අයුතු ඇතුල්වීම සම්බන්ධයෙන් අදාල බංගලාවේ මුරකරු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එහි පැමිණිලිකරු "*තමා 2023.08.16 සවස වැඩ අවසන් කර බංගලාවේ දොර ජනෙල් නිසිලෙස වැසූ බවත්, ගෙදර දොර හා ගේට්ටුවල යතුරු තමා ළඟ තිබෙන බවත්, වත්තේ බංගලාවේ බුහාරි මහත්මයා මිටින් තිබෙන බවත්, එහි ඉබ්බො දාලා වැසූ බවත්, වසා රාත්‍රී ගෙදර සිටින විට පාන්දර 03.30 ට පමණ ගෙදර ඉදිරිපස ශබ්දයක් ඇසූ බවත්, තමා එලියට පැමිණ බලන විට ගේට්ටුව ළඟ වීල් එකක් හා වෑන් එකක් නවත්වලා ඒ ආව අය හයියෙන් කථා කරමින් තමා වසා තිබුණ ගේට්ටුවේ ඉබ්බෝ කඩලා වෑන් එක සහ වීල් එක වත්ත ඇතුලට ගියා. ඒ වෙලාවේ ඒවායේ කවුද ඇවිත් සිටින්නේ රෑ නිසා දැක්කේ නැහැ. කී දෙනෙක් සිටියාද කියලා දන්නේ නැහැ.තමා මේ සිද්ධිය නිසා බය වුනා තමාට කරදරයක් කරයි කියලා තමා මේ අයගෙන් අහන්න ගියේ නැහැ.ඉක්මණට මේ ගැන ඒ වෙලාවේ බුහාරි මහත්තයාට කෝල් කරලා කිව්වා. මහත්තයා මේ ගැන පොලිසියට කියමු කියලා කීවා උදේ වෙන කොට බංගලාව ඇති ඉඩම් ඇතුලත බෞද්ධ කොඩි දාලා තිබුණා. තමා ඉන්න ගෙදර ළඟත් කොඩි දාලදැයි බලන විට බංගලාව ඇතුලේ කට්ටිය ඉන්නවා දැක්කා. තමා ළඟට ගිහින් බැලුවේ නැහැ. එතන ඉන්න අය කවුද කියන්න අමාරුයි. හාමුදුරුවෝ එහෙමත් ඉන්නවා දැක්කා. සමහර විට ඇතුලේ ඉන්න නිසා දොරවල් කඩලා එහෙමත් ඇති. පසුවදා උදේ බුහාරි මහත්තයා එතනට ආවා. එයත් බංගලාව ඇතුලට ගියේ නැහැ. පසුව තමයි අපි පොලිසියට එන්න ආවේ. මේ බංගලාවේ අයිතිය සම්බන්ධව විස්තර තමා හරියටම කියන්න දන්නේ නැහැ. බුහාරි මහත්තයා ඇතුලු කට්ටිය තමයි ආවේ ගියේ*" ලෙස සඳහන් කර ඇත.

13. උක්ත මුල් පැමිණිල්ලෙහි, පාන්දර 3.30ට පමණ ගේට්ටුවේ ඉබි කඩා සැකකරුවන් වෑන් රථයක් සහ ත්‍රීරෝද රථයකින් පැමිණ ඇති බව සඳහන් කර ඇති අතර, වින්දිත අතුල වික්‍රමනායක පැය 13.10ට අත්අඩංගුවට ගැනීමේ සටහන තුළ, අංක (අංකය සඳහන් කර නොමැත) දරණ යතුරු පැදියේ ස්විච් යතුර කලු පැහැති හෙල්මට් එකක් යතුරු කැරලි එකක් සැකකරුගේ පුද්ගලික දේපල ලෙස ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය වේ.

14. මුල් පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා මාතලේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උ.පො.ප. ඒකනායක පෙ.ව.09.00 ට පිට වන බවට 2023.08.17 පැය 09.00 ට පිටුව 14 ඡේදය 317 හි සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

15. මාතලේ පොලිස් ස්ථානයේ ග්‍රහණ අපරාධ තොරතුරු සටහන් පොතෙහි 2023.08.17 පැය 15.00 ට පිටුව 20 ඡේදය 322 යටතේ උ.පො.ප. ඒකනායක අදාල අපරාධ ස්ථානය පෙ.ව.09.15 ට නරඹා නිරීක්ෂණ සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ.

16. වගඋත්තර පාර්ශවය විසින් අදාල සිද්ධිය සම්පූර්ණයෙන් වීඩියෝගත කල බව 2023.12.01 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සඳහන් කර ඇති අතර වීඩියෝගත CD පටය ඉදිරිපත් කර ඇත. එහි වීඩියෝ දර්ශන කොටස් ලෙස සටහන්ව ඇති අතර MHM07250 යන වීඩියෝ පටය නිරීක්ෂණයේ දී, පොලිස් නිලධාරීන් බංගලාව වෙත පිවිසෙන අවස්ථාවේ දී පැමිණිලිකරු බංගලාව තුළ සිටින බව දර්ශනය නොවන අතර, ස්වාමීන් වහන්සේලා තිදෙනකු පුටුවල අසුන්ගෙන

සිටි බැවින් ස්ථානාධිපති ස්වාමින් වහන්සේලාට ආචාර කර ස්වාමීන් වහස්සේලා සමඟ කථාකර, ලේඛණයක් කියවමින් සිටින අවස්ථාවේ දී කහපැහැති කමිසයකින් සැරසුනු පැමිණිලිකරු දර්ශනය වන අතර දකුණු පසින් ඇවිදිමින් ස්ථානාධිපති ලිපිය කියවන අයුරු නිරීක්ෂණය කර ප්‍රධාන දොරටුව අසලට ගොස් මද වෙලාවක් හිදින අතරතුරදී වගඋත්තර ස්ථානාධිපතිවරයා ඔහුට බංගලාව තුළට යන ලෙසට දැනුම් දෙමින් අණ කරන අයුරු නිරීක්ෂණය වේ.

17. පැමිණිලිකරු ද අදාල සිද්ධිය වීඩියෝගත කල CD පටය විමර්ශණ කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර, වගඋත්තරකරුවන්ගේ වීඩියෝ දර්ශන අනුව වින්දිත ඔහුගේ ජංගම දූරකථනය කමිස සාක්කුවේ රදවාගෙන වීඩියෝගත කරන ලද වීඩියෝ දර්ශන මෙලෙස ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු පොලිස් නිලධාරීන් ස්ථානය වෙත පැමිණ ස්වාමීන් වහන්සේලා ඉදිරියේ ලේඛණයක් කියවමින් ප්‍රශ්න කරමින් සිටින අතරතුරදී වින්දිත බංගලාව තුලට දකුණු පස පැති දොරටුවකින් ඇතුල්වී එය නිරීක්ෂණය කර කෙමෙන් ප්‍රධාන දොරටුව අසලට ගොස් එහි සිටින අවස්ථාවේ දී ස්ථානාධිපතිවරයා බංගලාව ඇතුලට ඔහුට යන ලෙස අණකරන බවත්, ඔහු තම අනන්‍යතාවය ප්‍රකාශ කරන විට එයට සවන්නොදී ස්ථානාධිපතිවරයා බංගලාව තුළ අණ කරන ස්ථානයක් වෙත යොමු කරන බවත්, ඔහු අවස්ථා කිහිපයකදීම අනන්‍යතාවය ප්‍රකාශ කළ ද ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන බවත් නිරීක්ෂණය වේ.

18. ඉදිරිපත් කරන ලද වීඩියෝ දර්ශන සහ ස්වාමීන් වහන්සේලා විසින් ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශන් අනුව වින්දිත පැමිණිල්ල මඟින් ඉදිරිපත් කරන ලද පොලිස් නිලධාරීන් පැමිණීමෙන් පසුව අදාළ ස්ථානය වෙත පැමිණ ඇති බවට කරුණු අනාවරණය වන බව නිරීක්ෂණය වේ.

19. වින්දිත සඳහන් කර ඇති, සැකපිට අත් අඩංගුවට ගෙන පසුව මුදාහැරි පුද්ගලයා පිළිබඳව කරුණු විමසීමේ දී, අදාල පුද්ගලයා අපරාධය සිදු වූ ස්ථානයේදී අත්අඩංගුවට ගත් නමුත් පසුව ඔහුගෙන් ප්‍රශ්ණ කිරිමේදී ඔහු කන්දේ නුවර පොලිස්ථානයට අනුයුක්ත බුද්ධි නිලධාරියෙකු බව තහවුරු විමෙන් පසු ඔහු මුදාහැර ඇති බව වගඋත්තර පාර්ශවය දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ.

20. වින්දිත අත්අඩංගුවට ගෙන අයුතු ජනරාශියක සාමාජිකයක් වී ඉඩමට අයුතු ඇතුල් වී රාත්‍රී කාලයේ නිවසක් බිඳ දේපල වලට අනර්ථයක් සිදු කල බවට චෝදනා ගොනුකර බී1011/23 නඩුව පැවැරීම සිදුකර ඇති අතර, අපරාධය සිදුකර එම ස්ථානයේ රැදීසිටි අයවලුන් ලෙස වින්දිත අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

21. ස්ථානාධිපති විසින් 2023.08.21 දින අධිකරණයට කරුණු දක්වමින්, පැමිණිලිකරු පිළිබඳව විමර්ශනය කිරීමේ දී ඔහු මෙම සිද්ධියට ඍජුව සම්බන්ධ වූ බවට කරුණු අනාවරණය වූ බව සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ. වගඋත්තරපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව වගඋත්තර 02 උ.පො.ප ඒකනායක විමර්ශන නිලධාරියා වශයෙන් හා ස්ථානාධිපති අපරාධ අංශය වශයෙන් නඩුවට ඉදිරිපත්ව කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

22. වින්දිත අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි ඔහුව අත්අඩංගුවට ගැනිමේ හේතුව ප්‍රකාශ කර නොමැති අතර, පැමිණිලිකරු අදාල සිද්ධියට ඍජු ලෙස සම්බන්ධ වී ඇති බවට විමර්ශණයේ දී අනාවරණය වූ බවට අධිකරණයට දැනුම් දී ඇතත් ලිඛිතව හෝ වාචිකව ඒ සම්බන්ධව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කිරීමක් වගඋත්තරකරුවන් සිදුකර නොමැති බවත් නිරීක්ෂණය වේ.


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

23. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 11 කිසියම් තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඩුවමකට යටත් නොකල යුත්තේය යන අයිතිය තහවුරු කර ඇත.

24. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 12(1) නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිය තහවුරු කර ඇත.

25. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 13 (1) නීතියේ නියම කරනු ලැබූ කාරය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකල යුත්තේය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද, ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය යන අයිතිය තහවුරු කර ඇත.

26. <u>ධර්මසේන ස්වාමින්වහන්ස තවත් අය එදිරිව සංජීව මහානාම හා තවත් අය 1 Sri LR 81</u> ඩෙප් විනිසුරුවරයා දක්වා සිටියේ අත්අඩංගුවට ගැනීමට නියෝග කිරීම සඳහා සාධාරණ පැමිණිල්ලක්, විශ්වාසනිය තොරතුරක් හෝ සාධාරණ සැකයක් තිබිය යුතුය. පැමිණිල්ලක් ලැබීම මත සැම නිලධාරියෙකුටම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට අවසර නොලැබෙන අතර තොරතුරක් හෝ පැමිණිල්ලක් ලද පසු එම පැමිණිල්ල හා තොරතුර සාධාරණ පැමිණිල්ලක් ද විශ්වාසනිය තොරතුරක්ද යන්න අත්අඩංගුවට ගැනීමට පෙර තහවුරු කර ගත යුතු බවයි.

27. <u>ගනේෂන් සැම්සන් රෝයි. එදිරිව - ඒම්.එම්,ජානකු මාරසිංහ, ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාරතමේන්තුව SCFR 405/2018</u> නඩුවේදී ද දක්වා ඇත්තේ චෝදනාව විශ්වාස කළ හැකි බවට මතයක් ගොඩනගා නොගෙන, ලැබුණු පැමිණිල්ලක් මතම යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන්ට කල නොහැකි බවත්, පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නම් මිස අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරින් ක්‍රියාත්මක විය යුතු බවයි. හුදු පැමිණිල්ලක් මතම නිසි විමර්ශනයක් හා කරුණු සොයා බැලීමකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු බව ද ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් පැහැදිලි කර ඇති නමුත් මෙම සිදුවීමේ දී සිදුවීමට අදාළ පැමිණිල්ලේ සඳහන් පරිදි පාන්දර 3.30ට පමණ වින්දිත එම ස්ථානයේ රැදී සිටි බව අනාවරණය කර ගැනීමට නිසි විමර්ශනයක් සිදු නොකර වගඋත්තරකරුවන් එම ස්ථානයට ගිය පසු ස්ථානය වෙත පැමිණි වින්දිත අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

28. <u>බන්දුල සමරසේකර එ. විජිත අල්විස් ඕ.අයි.සී ගිනිගහේන පොලිස් ස්ථානය (SriLR 213)</u> දක්වා සිටියේ " පොලිස් නිලධාරියෙකුගේ යුතුකම වන්නේ ඔහුගේ උපරිම උත්සහාය සහ හැකියාව සියලු අපරාධ වැරදි හා මහජන පිඩා වැලැක්වීමට සහ වඩාත් වැදගත් ලෙස සාමය ආරක්ෂා කිරීමට භාවිතා කිරීම බවත් ඔහුගේ රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීමට නම් මහජනතාවගේ විශ්වාසය හා ගෞරවයෙන් රඳවා තබා ගත යුතු බවත් මහජනතාවගෙන් එවැනි විශ්වාසයක් හා ගෞරවයක් ලබා ගැනිමට නම් සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තුවනවාට වඩා උසස් සාදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු විය යුතු බවත්ය. නමුත් මෙම සිදුවීමේ දී වසර තිහක දේශපාලන කටයුතුහි සක්‍රීයව නිරතව මහජන ප්‍රසාදයක් දිනා සිටින පුද්ගලයකු වන වින්දිත අත්අඩංගුවට ගැනීමේ දී සහ පොලිස් ස්ථානයේ දී ස්වාමීන් වහන්සේලා, අන්‍යආගමික ජාතිකයන් සහ පොලිස් නිලධාරීන් ඉදිරියේ දී ප්‍රසිද්ධියේ වගඋත්තර 01 සහ වගඋත්තර 02 විසින් අවමන් සහගත සැලකිල්ලකට ලක්කර ඇති බවත් එය පොලිස් නිලධාරියකුගෙන් සිදුවිය නොහැකි සහ පොලිස් ස්ථානය අභ්‍යන්තරයේ සිදුනොවිය යුතු තත්වයක් බවත් නිරීක්ෂණය වේ.

29. තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධික්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් <u>තුරෙයි රාජා විනිසුරුතුමා විසින් ආර්.ඒ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය සහ තවත් අය (SCFR/505/19)</u> නඩුවේ දී දක්වා ඇත. මෙම සිදුවීමේ දී වගඋත්තර 01 පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සහ වගඋත්තර 02 අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් පැමිණිලිකරු නිසි විමර්ශනයකින් තොරව අත්අඩංගුවට ගැනීම සහ වෙනත් අය ඉදිරියේ පැමිණිලිකරු අපහසුතාවයට හා අවමානයට ලක්වන අයුරින් වාචිකව ප්‍රකාශයන් සිදුකර ඇති අතර එය ඔවුන්ගේ අධීක්ෂනය යටතේ සේවයේ නියුතු අනෙක් නිලධාරීන්ට ද වැරදි පූර්වාදර්ශයක් වන බව නිරීක්ෂණය වේ.

30. <u>එමිල් රන්ජන් එදිරිව නිතිපති</u> නඩුවේදි දක්වා ඇත්තේ, මහජන කැලඹීමක් ඇති විය හැකි බවට විමර්ශනයක් විසින් සිදු කරන හුදු ප්‍රකාශයක් මගින් පුද්ගලයෙකු රක්ෂිත බන්ධනාගාර ගත කළ නොහැකි බවත්, විමර්ශනය සඳහා සහාය දැක්වීම වශයෙන් පෙත්සම්කරු රක්ෂිත භාරයට පත්කරන ලෙස ඉදිරිපත් වී ඇති කරුණු සැලකිල්ලට ගත යුතු බවයි. මෙහිදී වගඋත්තර 02 විසින් නිසි විමර්ශනයක් සිදු නොකර අධිකරණය වෙත කරුණු වාර්තා කරමින් වින්දිත ඇතුළු පිරිස 2023.08.28 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස ඉල්ලීම් කර ඇති බවත් 2023.08.21 දින නැවත අධිකරණය වෙත පැමිණිලිකරු සෘජුව මෙම සිදුවීමට සම්බන්ධ බවට කරුණු අනාවරණය වූ බවට කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය**

පැමිණිල්ලක් ලැබීමෙන් පසු සෑම නිලධාරියෙකුටම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට අවසර නොලැබෙන අතර යම් තොරතුරක් හෝ පැමිණිල්ලක් ලද පසු එම පැමිණිල්ල හා තොරතුර සාධාරණ පැමිණිල්ලක් ද විශ්වාසනිය තොරතුරක්ද යන්න අත්අඩංගුවට ගැනීමට පෙර තහවුරු කර ගත යුතු අතර, හුදු පැමිණිල්ලක් මත නිසි විමර්ශනයක් හා කරුණු සොයා බැලීමකින් තොරව අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් පැහැදිලි කර ඇත.

ඒ අනුව පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති කරුණු හා සාක්ෂි අනුව, වගඋත්තර 01 එම්.ජී.යු.අයි.ගුණවර්ධන (ප්‍ර.පො.ප) සහ වගඋත්තර 02 ඩබ්.ජී.ඒකනායක (උ.පො.ප) විසින් මාතලේ පොලිස් ස්ථානයට ලද මුල් පැමිණිල්ලේ සඳහන් සිද්ධියට පැමිණිලිකරු සම්බන්ධ බවට කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම මගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 13 (1) ව්‍යවස්ථාව , නිසි විමර්ශණයක් සිදු නොකිරීම මගින් 12(1) ව්‍යවස්ථාව සහ අත්අඩංගුවට ගැනීමේ දී "තමුසේ මාව අඳුරනවාද? තමුසේව අල්ලගන්න මං හුගාක් කාලයක් තිස්සෙ බලාන හිටියේ, දවසක් මම තමුසේ පව් කියලා අතැරියා. අද බලා ගන්නම්..යමං...", සහ අත්අඩංගුවට ගැනීමෙන පසු "හාමුදුරුවන් විතරක් නෙවෙයි රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතියත් ගෙවල් බිදින්ට සම්බන්ධ වෙලා තියෙනවා", " තොපි වගේ දේශපාලනඥයන් තමයි රට බංකොලොත් කළේ. තොපි වගේ එවුන් මගේ ලඟටවත් එන්න එපා. කාලකණ්නි...." සහ "මේකා තමයි මේකේ නායකයා මේකත් එක්ක ගිහිල්ලා තමයි ගෙවල් කඩලා තියන්නේ" ලෙස වචන ප්‍රසිද්ධියේ භාවිතා කර ප්‍රකාශ කිරීමෙන් ස්වාමීන්වහන්සේලා ඇතුළු පිරිස ඉදිරියේ අවමන් සහගත සැලකිල්ලට ලක්කිරීම (Degrading treatment) මගින් 11 වන ව්‍යවස්ථාව ද උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරමු.

ඒ අනුව පහත සඳහන් නිර්දේශය සිදු කර සිටී.

1. වගඋත්තර 01 එම්.ජී.යූ.අයි.ගුණවර්ධන (ප්‍ර.පො.ප) සහ වගඋත්තර 02 ඩබ්.ජී.ඒකනායක (උ.පො.ප) විසින් වින්දිත එම්.ඒ.එස්. වික්‍රමනායක වෙත රු. 100,000.00මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතුය.

2. 01,02 වගඋත්තකරුවන් මෙම සිදුවීමේ දී කටයුතු කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2025. 09 . 24 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මහාචාර්ය ටී.තනරාජ්
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Prof. T. Thanaraj
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත් : 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය,බත්තරමුල්ල.

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.